

### බෙදුම්වාදී මාර්ග සිතියමේ පනත් 8 කින් 1 කට පමණක් ව්‍යාජ ලෙස විරුද්ධවීම මගින්.....

## දෙමළ බෙදුම්වාදී පක්ෂවල මන්ත්‍රීවරුන් විසින්, පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් ගොනාට ඇන්දවීම:

# රහස කුමක්ද? අනතුර කුමක්ද?

යහපාලන ආණ්ඩුව පිහිටුවීමෙන් පසුව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015.3.25 දින දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ජාතික සමගිය සහ සංහිඳියා කාර්යාලය පිහිටුවනු ලැබීය. එම පත්‍රිකාවේ ඔහු සඳහන් කරන්නේ ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා තම ආණ්ඩුව දක්වන්නා වූ උනන්දුව ජාත්‍යන්තර ප්‍රජාව වෙත ප්‍රදර්ශනය කිරීම සඳහා නීත්‍යානුකූල ආයතනයක් ලෙස එවැන්නක් පිහිටවිය යුතු බවය. ජාත්‍යන්තර ප්‍රජාව යන්නට ඩයස්පෝරාව විශේෂයෙන් අයත් වන බව ඉතා පැහැදිලිය. යහපාලන ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා දෙස් විදෙස් බෙදුම්වාදී බලවේග විසින් ඉටුකළ භූමිකාවට කෘතගුණ දැක්වීම සඳහා තමා කැපවන බවට මූලික පණිවිඩයක් ලබාදීම ඒ මගින් සිදුවිය. පසුගිය ජනවාරි 09 වැනිදා දෙමළ බෙදුම්වාදී පක්ෂ විරුද්ධව ඡන්දය ලබාදෙමින් සහ පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් ඊට පක්ෂව ඡන්දය ලබාදෙමින් සම්මත කරනු ලබන්නේ එසේ පරිපාලන වශයෙන් පිහිටවූ කාර්යාලය තවදුරටත් බලවත් කිරීම සඳහා අවශ්‍ය වන නීතිමය රාමුවය.

එදා 2009 දී බෙදුම්වාදී යුද්ධයේ පරාජයට පසුව දින 3ක් ඇතුළත බංකිමූන් ශ්‍රී ලංකාවට කඩා පැන ආරම්භ කළ ක්‍රියාවලිය මගින් පරාජය සමඟ බෙදුම්වාදීන්ට අහිමි වූ කේවල් කිරීමේ බලය නැවත ලබාගත හැකි විය. එනම් ප්‍රභාකරන්ගේ තුවක්කුව වෙනුවට මානව හිමිකම් කෙවිට මගින් ආණ්ඩුව බිය ගැන්වීමේ ක්‍රියාවලිය ආරම්භ විය. පළමු වටයේදී ඊට බිය වූ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා 2009 සැප්තැම්බර් මාසයේදී එවකට ජිනීවාහි නිත්‍ය නියෝජිත ආචාර්ය දයාන් ජයතිලක මගින් 13 වැනි සංශෝධනය බලාත්මක කරන බවට එකඟ වූ යෝජනාවට සමානුග්‍රහය දැක්වීය. එනම් 13 වැනි සංශෝධනයට එරෙහිව පවතින ව්‍යවස්ථාමය බාධක ඉවත් කර පූර්ණ ෆෙඩරල් රාජ්‍යයක් බෙදුම්වාදීන්ට ලබාදෙන බවට ඔහු පොරොන්දු විය. රජීව් ගාන්ධි විසින් එවැනි පොරොන්දුවක් ලබාදීමෙන් පසුව ප්‍රභාකරන් අවි බිම තැබීමට එකඟ විය. නමුත් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් පනවන ලද ව්‍යවස්ථාමය බාධක මඟින් එම පොරොන්දුව කඩ වූ බැවින් ඔහු විසින් නැවත ආයුධ අතට ගනු ලැබීය. ඒ අනුව යුධ ජයග්‍රහණයෙන් පසුව මහින්ද රාජපක්ෂ විසින් ප්‍රභාකරන් ඉල්ලා සිටි දේ ලබාදීමට එකඟ වූ බව පිළිගැනීමට සිදුවේ.

නමුත් ඔහුව බලයට පත් කළ සහ යුද්ධය මගින් ත්‍රස්තවාදය පරාජය කළයුතු බවට මතවාදය සකස් කළ ජාතිකවාදී බලවේග නිසා එම පොරොන්දුව ඉටු කිරීමට මහින්ද රාජපක්ෂට අවස්ථාව නොලැබිණි. ඉන්පසුව යුද්ධයට නායකත්වය ලබාදුන් ප්‍රධාන හමුදා නිලධාරියාට උතුරේ සහ නැගෙනහිර බහුතර ඡන්ද ලබාදීමට දෙස් විදෙස් බලවේග මැදිහත් වන තත්ත්වයක් තුළ පවා මහින්ද රාජපක්ෂට ප්‍රබල ජයක් අත්වන්නේ ජාතික බලවේගවල මතවාදයට ඔහු යටත් වීම නිසාය. ඒ අනුව ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ජාලයේ 'ගෝඩ් ෆාදර්' ලෙස සලකන ලැබූ 'ඉන්ටර් නැෂනල් ක්‍රයිසීස් ගෘප්' නමැති සංවිධානයේ ප්‍රධානී ඇලන් කීනන් 2012 දී බී.බී.සී. නාලිකාව හරහා පවසන්නේ මහින්ද රාජපක්ෂ බලයේ සිටින තුරු දෙමළ ජනයාගේ ගැටළුවට සාධාරණ

විසඳුමක් ලබාදිය නොහැකි බවය. එම වසරේදීම මඩකලපුවේදී ඉලංගෙයි තමිල් අරසු කච්චි පක්ෂයේ සමුළුවක් අමතමින් ආර්. සම්බන්ධන් මහතා සඳහන් කරන්නේ තමා ඊලාම් අරමුණු අතහැර නැති බවත් නමුත්, ඒ කරා ළඟාවන උපාය මාර්ගය වෙනස් කරන බවය. එනම් යුද්ධය වෙනුවට ගාන්ධිවාදී, අවිහිංසාවාදී සටන් උපක්‍රම තෝරන බවය.

මහින්ද රාජපක්ෂ බෙදුම්වාදී බලවේග වලට 2009 දී ලබාදුන් පොරොන්දු ඉටු නොවන තත්ත්වයක් තුළ ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලය විසින් 25/1 යෝජනාව මඟින් ශ්‍රී ලංකාවට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මහ කොමසාරිස්ගේ වාර්තාවක් කැඳවනු ලැබීය. ඒ අනුව 2015 දී ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවලට බරපතළ යුධ අපරාධ චෝදනා එල්ල කරමින් මානව හිමිකම් කොමසාරිස්ගේ වාර්තාව නිකුත් විය. එම වාර්තාවට සමගාමීව 30/1 යෝජනාව නමින් ශ්‍රී ලංකාවේ රජය විසින් ඉටු කළ යුතු කොන්දේසි මාලාවක් ඉදිරිපත් විය. ඒ මගින් බෙදුම්වාදී න්‍යාය පත්‍රයට අනුව මාර්ග සිතියමක් සහිතව එම යෝජනා ඉදිරිපත් වූ අතර ඊට  සමානුග්‍රහය දැක්වීම සඳහා විදේශ අමාත්‍ය මංගල සමරවීර සහ එම්.ඒ. සුමන්තිරන් ඇතුළු බෙදුම්වාදී නායකයින් සමඟ ඇමරිකාවේදී එකඟතාවයක් ඇති කරගත් බව ''ද අයිලන්ඩ්'' පුවත්පත වාර්තා කළේය. ඒ අනුව පැහැදිලි වන්නේ 30/1 යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඊනියා රෙජීම් චේන්ජ් ක්‍රියාවලියක් හෙවත් ආණ්ඩු වෙනසක් අවශ්‍ය වූ බවය. එම පූර්ව කොන්දේසි ඉටු කර ගැනීම සඳහා ඇමරිකානු කොංග්‍රස් මණ්ඩලය විසින් ඩොලර් මිලියන 450ක් වෙන් කළ බව රාජ්‍ය ලේකම් ජෝන් කෙරී නිල වශයෙන් පිළිගනු ලැබීය.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මගින් 30/1 යෝජනාවට එකඟතාවය ලබා ගත නොහැකි බවට ඩයස්පෝරාව තීන්දු කරනු ලබන්නේ 2009 පොරොන්දුව ඉටු නොකිරීම නිසා පමණක් නොව ඉන්පසුව ජාතික බලවේගවල බලපෑම මත ඔහු විසින් ගනු ලැබූ සෙසු ක්‍රියාමාර්ග ප්‍රමාණයක් ද නිසා ය. ඒ අතරින් පළමුවැන්න 2010 දී උගත් පාඩම් කොමිසම් පිහිටුවීම මගින් ඊනියා ප්‍රශ්නය විසඳීමේ බලය ජාත්‍යන්තරය විසින් අත්පත් කර ගැනීමට ඉඩ ලබා නොදී ඇමරිකාව සහ බ්‍රිතාන්‍ය ආදර්ශය අනුව දේශීයව ක්‍රියාමාර්ග ගන්නා බවට ජාත්‍යන්තරයට පොරොන්දුවක් ලබාදීමය. නමුත් එය ජාත්‍යන්තර බෙදුම්වාදී න්‍යාය පත්‍රයට බාධාවක් වන බව ඉතා හොඳින් පැහැදිලි වූයේ එම කමිටුවේ වාර්තාව නිකුත් වීමට පෙර එනම් කමිටුව පිහිටුවා මාස තුනකට පසුව දරුස්මාන් කමිටුව නමින් බන්කිමූන් විසින් ඊනියා විද්වත් කමිටුවක් පිහිටුවීම නිසාය. දරුස්මාන් වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවලට එරෙහිව පළමු වටයේදී ජාත්‍යන්තර පිළිගැනීමක් ඇතිවන ආකාරයට යුද අපරාධ චෝදනා එල්ල කරනු ලැබීය. ඉන්පසුව ඊට මුහුණ දීම සඳහා අතුරුදහන්වූවන් පිළිබඳව සොයා බැලීම සඳහා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් ජනාධිපති කොමිසමක් පිහිට වූ අතර එම කොමිසමේ දෙවන බලාධිකාරිය ලෙස ජාත්‍යන්තර යුද අපරාධ විශේෂඥයින් 5 දෙනකු මගින් විද්වත් වාර්තා කැඳවනු ලැබීය.

එම තත්ත්වය තුළ මානව හිමිකම් කෙවිට යොදා ගනිමින් බෙදුම්වාදී න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාම සඳහා ඉහත සඳහන් කළ ආකාරයට රෙජීම් චේන්ජ් මෙහෙයුමක් අවශ්‍ය විය. ඉන් පසුව ඉහත සඳහන් කළ ආකාරයට රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා විසින් ආණ්ඩුව පිහිටුවා දින කිහිපයක් තුළ ජාතික සමගිය සහ ප්‍රතිසන්ධාන කාර්යාලය පිහිටුවා තමා බෙදුම්වාදී අපේක්ෂා ඉටු කිරීමට  සූදානම් බව පෙන්විය. ඒ මගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවලට එරෙහිව මානව හිමිකම් කවුන්සිලයේ නිල මුද්‍රාව සහිතව යුධ අපරාධ චෝදනා එල්ල කරනු ලැබූ 2015 මහ කොමසාරිස් වාර්තාව සහ බෙදුම්වාදී මාර්ග සිතියමට අනුව ඉදිරිපත් වූ 30/1 යෝජනාව ස්තූති පූර්වකව පිළිගැනීම සඳහා පදනම සකස් කරනු ලැබීය. ඒ ආකාරයට තම රටේ ආරක්ෂක හමුදාවලට එරෙහිව ඉතාමත් අසාධාරණ ලෙස සහ ස්වාභාවික යුක්තියට පටහැනිව එල්ල කළ යුධ අපරාධ චෝදනා ස්තූති පූර්ව පිළිගැනීම ලෝකයේ කිසිදු රටක සිදුවී නැති වුවද යහපාලන රජය විසින් ලෝක වාර්තාවක් තබමින් එසේ කරනු ලැබීය.

යහපාල රජය විසින් එසේ 30/1 යෝජනාව ස්තූති පූර්වකව භාර ගැනීමට පෙර සිටම එහි අඩංගු වූ ආරක්ෂක හමුදාවලට පරිපාලන වශයෙන් දඬුවම් කිරීමේ ක්‍රියාවලිය සහ 13 වැනි සංශෝධනය පූර්ණ වශයෙන් බලාත්මක කිරීමට අදාළ ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය ද ආරම්භ කරනු ලැබීය. ඉන්පසුව 30/1 යෝජනාවේ අඩංගු ප්‍රකාශිත සහ එහි මූලික හරයට අයත් එහෙත් අප්‍රකාශිත ක්‍රියාමාර්ග මගින් බෙදුම්වාදී න්‍යාය පත්‍රයට අදාළ මාර්ග සිතියමේ අඩංගු අංග එකින් එක ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. එහිදී ආරක්ෂක හමුදා දුර්වල කිරීම සහ 13 වැනි සංශෝධනය බලාත්මක කිරීම යන අවසන් උපායමාර්ගික අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන මහා පින්තූරය නිර්මාණය කිරීම සඳහා නීතිමය රාමු 8ක් හඳුන්වාදීමට යහපාලන ආණ්ඩුව විසින් සැලසුම් කළ බව මහජනයාට පැහැදිලි වන්නේ ඒවා එකින් එක ක්‍රියාත්මක වන විටය.

**එසේ සම්මත කිරීමට නියමිත වූ නීතිමය රාමු සහ ඒවායේ අරමුණු මෙසේ සාරාංශ ලෙස දැක්විය හැක.**

1. **අතුරුදහන් පුද්ගලයන් පිළිබඳ කාර්යාල පනත - 2016:**

   එම නීතිය මඟින් සාක්ෂි ආඥා පනත අදාළ නොවන ලෙස ඊනියා අතුරුදහන්වීම් පිළිබඳව ආරක්ෂක හමුදාවලට එරෙහිව චෝදනා සහ සාක්ෂි ගොනු කිරීමේ දේශීය යාන්ත්‍රණය ආරම්භ විය. ඒ මගින් අණදීමේ වගකීමට අදාළව චෝදනා ගොනුකිරීමට ප්‍රතිපාදන සැලසුනු අතර ඒ අනුව එම යාන්ත්‍රණය එක්තරා ආකාරයක චෝදනා කර්මාන්ත ශාලාවක් බවට පත්විය. නමුත් එවකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ජාතික බලවේගවල ප්‍රබල ඉල්ලීම පරිදි එම කාර්යාලය තමා යටතට ගැසට් කර ගැනීම මගින් ප්‍රායෝගිකව එම ක්‍රියාවලියට තිරිංග දමනු ලැබීය. (එම හේතුව මත පසුකාලීනව ජාත්‍යන්තර මානව හිමිකම් කොමිසම මගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා නිලධාරීන්ට විරුද්ධව යුද අපරාධ චෝදනා සහ සාක්ෂි ගොනුකිරීමේ ජාත්‍යන්තර යාන්ත්‍රණයක් පිහිටුවනු ලැබීය.)

2. **පිටුවහල් කිරීමේ සංශෝධන පනත - 2017:**

   එම පනත මගින් මහ කොමසාරිස් වාර්තාව විසින් යෝජනා කළ පරිදි ජාත්‍යන්තර අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා යුද අපරාධ චෝදනාවන්ට ලක්වන ආරක්ෂක හමුදා නිලධාරීන් පිටුවහල් කිරීමට පහසුකම් සැළසීය. එම සංශෝධනය මගින් පොදුරාජ්‍ය මණ්ඩලයේ රටවල් අතර පැවති එකඟතාවය තවදුරටත් පුළුල් කරනු ලැබීය.

3. **වන්දි ගෙවීම පිළිබඳ කාර්යාල පනත - 2018:**

   එම පනත මගින් යුද අපරාධ චෝදනාවලට ගොදුරු වූ බවට සැළකෙන අතුරුදහන් වූවන් ඇතුළු සෙසු වින්දිතයන්ට සහන ලබාදීම සඳහා නීතිමය ප්‍රතිපාදන පනවනු ලැබීය.

4. **බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වැළැක්වීමේ අන්තර්ජාතික ප්‍රඥප්ති පනත - 2018:**

   එම නීතිය මඟින් අතුරුදහන් කිරීම වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තරය ප්‍රඥප්තියේ අන්තර්ගත ප්‍රතිපාදන දේශීය නීතියට ඇතුල් කරනු ලැබූ අතර ඊට අමතරව දේශියව යුද අපරාධ මහාධිකරණයක්ද පිහිටුවනු ලැබීය.

5. **අපරාධ කටයුතු පිළිබඳව අන්‍යෝන්‍ය සහයෝගිතා පනත - 2018:**

   මෙම නීතිය මඟින් යුධ අපරාධ චෝදනාවට ලක් වූ ආරක්ෂක හමුදා නිලධාරීන්ට අදාළ චෝදනා සහ සාක්ෂි විදේශිය රටවල අභිචෝදකයින්ට ලබාදීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට බැඳීමක් ඇතිවන අතර වැරදිකරුවන්ට අදාලව පැනවෙන දඬුවම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට බැඳීමක් ඇතිවේ.

6. **වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සහ සහාය ලබාදීමේ පනත - 2023:**

   මෙම පනත මගින් 2015 පනත තවදුරටත් ශක්තිමත් වේ. ඒ මගින් අධිකරණයකදී හෝ අනාගතයේදී පිහිටුවන ලබන සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසංධාන කොමිසම වැනි කොමිසකමදී සාක්ෂි ලබාදෙන අතුරුදහන් වූවන්ගේ ඥාතීන් සහ වද බන්ධනයන්ට ලක්වූ බවට පිළිගන්නා පුද්ගලයින්ට විශේෂිත ආරක්ෂාවක් ලැබෙන අතර අදාළ සාක්ෂි ඉලෙක්ට්‍රොනික් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය මගින් ලබාදීමට නීත්‍යානුකූලව ඉඩ සැලසේ. ඒ අනුව විදේශවල සිටින පුද්ගලයින්ට හරස් ප්‍රශ්න ඇසීමට ලක් නොවී ගොතන ලද සාක්ෂි ඉදිරිපත් කරමින් චෝදනා එල්ල කිරීමට හැකියාව ලැබේ. නමුත් චෝදනාවලට පාත්‍රවන ආරක්ෂක හමුදා නිලධාරීන්ට ඊට එරෙහිව කිසිදු පියවරක් ගත නොහැක.

7. **ජාතික සමගිය සහ සංහිඳියාව කාර්යාල පනත - 2023:**

   මෙම පනත මගින් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා විසින් තමා බලයට පත් වූ විගස පිහිටවූ කාර්යාලයට නීතිමය ආවරණය ලැබේ. 2024 ජනවාරි 9 වැනිදා මෙම පනත සම්මත කිරීමේදී ටී.එන්.ඒ. පක්ෂය, ඒ.සී.ටී.සී. පක්ෂය සහ ඒ.අයි.ටී.සී යන දෙමළ බෙදුම්වාදී පක්ෂවල මන්ත්‍රීවරුන් ඡන්දය දීමෙන් වැලකී සිටියේය. එහිදී පුදුමයට කාරණය වූයේ ඊට පෙර ඩයස්පෝරාව ප්‍රමුඛ එම මන්ත්‍රීවරුන් 2015 සිටම අදාල නීති වහා සම්මත කළ යුතු බව ජාත්‍යන්තරව සහ දේශීයව බලපෑම් කිරීමය. ඒ අනුව එම ක්‍රියාවේ යම් යටි අරමුණක් තිබෙන බව පැහැදිලි විය.

**8. සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිසම් පනත (2023 ගැසට් කරනු ලැබීය)**

මෙම පනත මගින් ඉහත සඳහන් කළ නීතිමය රාමු 7ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අදාළව උපදෙස් ලබාදීම, සහාය ලබාදීම, එකඟතාවය ඇතිකර ගැනීම ආදී වශයෙන් සමස්තය හැසිරවීම සඳහා බලවත් ප්‍රතිපාදන පනවා ඇත.

ඒ අනුව සත්‍ය සෙවීමේ කොමිසම පිහිටුවීම මගින් බෙදුම්වාදී මාර්ග සිතියමට අනුව අවසන් සැතපුමට ළඟාවීමට හෙවත් අදාල විවිධ පියවර අවසන් කිරීම අපේක්ෂා කරන බව පිළිගත හැක. 2015 සිට එනම්, 30/1 යෝජනාවේ සිට පසුගිය 2022 සැප්තැම්බර් ජාත්‍යන්තර මානව හිමිකම් කොමසාරිස් වාර්තාව මගින් පවා අවධාරණය කළ මෙම කොමිසමේ නීතිමය රාමුව පිහිටුවීමේ ක්‍රියාවලිය අවසානයට ඉටු කරනු ලබන්නේ එම අරමුණ සහිතව බව ඉතා පැහැදිලියි. එම නීතිය සෙසු නීතිවලට පෙර සම්මත කිරීමට උත්සාහ කළේ නම් සමස්ථ 'ගේම් ප්ලෑන්' එක එළිදරව් වීම වැළැක්විය නොහැක. විශේෂයෙන්ම පාපොච්චාරණ මගින් යුද අපරාධ චෝදනා එල්ල කිරීම සඳහා ප්‍රතිපාදන පැනවීම තුළ ඊට එරෙහිව එල්ල වන විරෝධය නිසා සෙසු පනත්වලට ද එරෙහිව ප්‍රබල විරෝධයක් පැන නැගීමේ හැකියාව තිබුණි. මෙම පනත මගින් ප්‍රබල ජාත්‍යන්තර මැදිහත්වීමකටද අවස්ථාව සැලසෙන බැවින් දැනුම්වත් පිරිස අතර එහි භයානකකම වඩාත් තහවුරු වේ. ඒ අනුව එම පනත 8 වැන්න ලෙස අවසානයට ගෙනෙනු ලබන්නේ හේතු සහිතව බව ඉතා පැහැදිලිය.

සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිසම පනත සම්මත කිරීමට පෙර ඉදිරිපත් කළ ප්‍රතිසන්ධාන කාර්යාල පනතට එරෙහිව දෙමළ බෙදුම්වාදී පක්ෂ විසින් ඡන්දය ප්‍රකාශ කරන්නේ ඉන්පසුව ඉදිරිපත් කිරීමට නියමිත සත්‍ය සෙවීමේ කොමිෂන් පනතට එරෙහිව එල්ල වන විරෝධය සමනය කර ගැනීමේ අරමුණ ඇතිව බව ඉතා පැහැදිලිය. ඔවුන් දිගින් දිගටම සම්මත කළ යුතු බවට බලපෑම් කළ පනත් අතරින් බෙදුම්වාදී මාර්ග සිතියමට අනුව අවම බලපෑම සහිත පනත මෙම සංහිඳියා කාර්යාල පනත බව පිළිගත හැක. එය දැනටමත් අමාත්‍ය මණ්ඩල තීන්දුවක් අනුව පිහිටුවා ඇති සහ පරිපාලන වශයෙන් ක්‍රියාත්මක වන ආයතනයකි. ඒ අනුව මෙම සැලසුම් සහගත විරෝධය පළ කිරීම මගින් එම පනත බෙදුම්වාදීන්ට අවශ්‍ය ආකාරයට සකස් වී නොමැති බවට මහජන මතයක් ගොඩනැගීමේ හැකියාව ලැබේ . ඒ මගින් එහි අනතුරුදායක ප්‍රතිපාදන අඩංගු නොවන බවට ව්‍යාජ සමාජ මතයක් ගොඩනැගිය හැක.

අනෙක් පැත්තෙන් ගත් විට ඔවුන් විරුද්ධ වුවද පනත සම්මත වන බවට ඔවුන්ට විශ්වාසයක් තිබූ බව ඉතා පැහැදිලිය. ඊට හේතුව මේ වන විට හිමාලයා ප්‍රකාශය හරහා ආණ්ඩුව සහ ඩයස්පෝරාව අතර සිදුවන ද්විපාර්ශක ක්‍රියාවලිය අවබෝධයක් සහිතව සිදුවන බව සැකයකින් තොරව පිළිගත හැකිවීමය. හිමාලයා ප්‍රකාශය නිකුත් වන්නේ 13 වැනි සංශෝධනය බලාත්මක කිරීමට එරෙහිව මහානායක හිමිවරුන් විසින් මහජනයාට සහ ජනාධිපතිවරයාට පනවන ලද මානසික බාධක ජය ගැනීම සඳහා බවටද සැකයක් නැත. විශේෂයෙන්ම ජනාධිපතිවරයාගේ යාපනයේ කතාව මගින් එතුමා ආරක්ෂාකාරී ප්‍රවේශයකට මාරුවී බෙදුම්වාදීන්ට ප්‍රහාරාත්මක ප්‍රවේශය භාරදීම් මගින් ඒ බව පැහැදිලිවේ. ඒ අනුව බෙදුම්වාදී මන්ත්‍රීවරුන් සහ ආණ්ඩුව අතර ඇතිකරගත් එකඟතාවයක් මත ඔවුන් විසින් පනතට විරුද්ධව ඡන්දය පාවිච්චි කළ බව ඉතා පැහැදිලිය. ඒ අනුව සමස්ත ක්‍රිකායවලිය තුළ ඉතා බරපතලම සහ දුෂ්ටතම පනත්වන සත්‍ය සෙවීම සහ ප්‍රතිසන්ධාන කොමිසම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන විට ඊට එරෙහිව ද බෙදුම්වාදීන් විසින් ඡන්දය ප්‍රකාශ කළහොත් මහජනයා පුදුම නොවිය යුතුය. ඒ මගින් පොහොට්ටුවේ මන්ත්‍රීවරුන් අතර ව්‍යාජ සුබවාදී මතයක් ගොඩනගමින් ඔවුන් ගොනාට අන්දවා පනත සම්මත කරගැනීම වඩා සුදුසු බවට බෙදුම්වාදීන් සහ ජනාධිපතිවරයා අතර එකඟතාවයක් ඇතිකර ගැනීමද ඉඩ තිබෙන බවට සමස්ත ක්‍රියාවලිය හැදෑරීමේදී උපකල්පනය කිරීමට හැකියාවක් ඇත.